සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

60 S I

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I කාලය : පැ. 01යි.**

උපදෙස්
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) කසුන්ගේ ව්‍යාපාරය ලාභ අපේක්ෂිත ව්‍යාපාරයකි. එම ව්‍යාපාරයේ දැකිය හැකි ප්‍රධාන අරමුණක් වන්නේ,
(1) රැකියා උත්පාදනය (2) භාණ්ඩ හා සේවාවල ගුණාත්වය ඉහළ නැංවීම
(3) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම (4) සේවක සුභසාධනය

(02) භෞතික ආයතන නොමැතිව වර්තමානයේ ව්‍යාපාර කටයුතු කරනු ලබයි. මේ සඳහා යොදාගනු ලබන ප්‍රධාන පහසුකම කුමක් ද?
(1) ෆැක්ස් යන්ත්‍රය (2) අන්තර්ජාලය (3) පරිගණකය (4) දුරකථනය

(03) ''තමන්ගේ තීරණවල සාර්ථක අසාර්ථකභාවය'' අරමුණු කොටගෙන ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවය කුමක් ද?
(1) කළමනාකරුවන් (2) සේවකයින් (3) අයිතිකරුවන් (4) සැපයුම්කරුවන්

(04) භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) සපයන්නාගෙන් වෙන කළ නොහැකි වීම. (2) ස්පෘශ්‍ය වීම.
(3) ගබඩා කළ නොහැකි වීම. (4) සපයන්නා අනුව විවිධ වීම.

(05) ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධකයට පමණක් අයත් වන දෑ අඩංගු පිළිතුරු වන්නේ කුමක් ද?
(1) ගොඩනැගිලි, බොරතෙල්, මුදල්, රථවාහන
(2) රථවාහන, මුදල්, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර
(3) ගල් අඟුරු නිධියක්, යන්ත්‍ර සූත්‍ර, මුදල්, ගොඩැගිලි
(4) යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, රථවාහන, ගල් අඟුරු නිධියක්

(06) යම් ව්‍යාපාරයක් වංචා සහගත ලෙස පාරිභෝගිකයෙකු නොමඟ යැවූ විට ඊට එරෙහිව නඩු පවරනු ලබන්නේ,
(1) පාරිභෝගික අයිතිවාසිකම් පනතට අනුවය. (2) වෙළෙඳපොළ වංචා වැලැක්වීමේ පනතට අනුවය.
(3) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතට අනුවය. (4) ව්‍යාපාර වගකීම් පනතට අනුවය.

(07) ඇල්මැති පාර්ශවයක් ලෙස 'රජය' ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුවක් නොවන්නේ පහත සඳහන් දෑ අතුරින් කවරක් ද?
(1) සමාජයට ව්‍යාපාරයෙන් වන සේවය පිළිබඳ අවධානය යොමු කිරීම.
(2) ව්‍යාපාරය තම බදු ආදායම නිසිලෙස ගෙවන්නේ ද? පිළිබඳ සොයා බැලීම.
(3) රැකියා අවස්ථා උත්පාදනය තුළින් විරැකියාව සඳහා විසඳුම් ලබා ගැනීම.
(4) ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීම.

(08) ව්‍යාපාරය සඳහා වන විදුලිය සැපයීම්, ජලය ලබා දීම, භූමිය සංවර්ධනය හා මහා මාර්ග තැනීම යනාදී කටයුතු හැඳින්වෙන්නේ, ව්‍යාපාරයකට අවශ්‍ය,
(1) අත්‍යාවශ්‍ය සේවා ලෙසය. (2) සහනාධාර ලෙසය.
(3) යටිතල පහසුකම් ලෙසය. (4) පාරිසරික සාධක ලෙසය.

(09) ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික සාධක ඇතුළත් දෑ ආර්ථික පරිසරයට අයත් වේ. දී ඇති පිළිතුරු අතරින් ආර්ථික පරිසරයට පමණක් බලපාන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පොලී අනුපාතය, උද්ධමනය, ඉතුරුම්, නව යන්ත්‍ර සූත්‍ර
(2) පොලී අනුපාතය, උද්ධමනය, ඉතුරුම්, නිෂ්පාදන ක්‍රම
(3) පොලී අනුපාතය, උද්ධමනය, ඉතුරුම්, ජාත්‍යන්තර සම්බන්ධතා
(4) පොලී අනුපාතය, උද්ධමනය, ඉතුරුම්, ප්‍රවාහනය

(10) පහත දැක්වෙන සිදුවීම් අධ්‍යයනය කරන්න. මෙයින් තාක්ෂණික පරිසරයට පමණක් අයත්වන සිදුවීම් ඇතුළත් පිළිතුර වන්නේ,
a. සරල අත් යන්ත්‍ර වෙනුවට නවීන යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම.
b. බැංකු තැන්පතු සඳහා පොළී අනුපාතය ඉහළ දැමීම.
c. සාමාන්‍ය තැපැල වෙනුවට විද්‍යුත් තැපැල භාවිත කිරීම.
d. පොත්වල තැබූ ගිණුම් සටහන් වෙනුවට එම ගිණුම් තොරතුරු පද්ධති ඇසුරින් පවත්වාගෙන යාම.
(1) a, b, c (2) a, b, d (3) b, c, d (4) a, c, d

(11) ගෝලීයකරණයේ දී සිදුවිය නොහැකි අවස්ථාවක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) ආර්ථික, සමාජයීය හා සංස්කෘතික බැඳීම. (2) මිනිසුන් අතර දේශ සීමා දුරස්ථභාවය වැඩි වීම.
(3) රටවල් අතර ව්‍යාපාර කටයුතු නිදහසේ සිදු වීම. (4) මුළු ලෝකය ම එක විශ්ව ගම්මානයක් බවට පත් වීම.

(12) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමක් ලෙස දැක්විය හැක්කේ,
(1) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම. (2) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.
(3) නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම. (4) කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි වීම.

(13) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාරයක් ලෙස සමිති සංවිධාන දැක්විය හැක.
(2) හිමිකාරිත්වය මත පෞද්ගලික හා රාජ්‍ය (පොදු) ලෙස ව්‍යාපාර වර්ග කළහැක.
(3) සමූපකාර සමිති රාජ්‍ය (පොදු) අංශයේ ව්‍යාපාරවලට අයත් වේ.
(4) රාජ්‍ය සංස්ථා, රාජ්‍ය (පොදු) අංශයට අයත් ව්‍යාපාරයකි.

(14) පහත දැක්වෙන වගුව අධ්‍යයනය කර A තීරුව B තීරුව සමග නිවැරදිව ගළපා ලබා දී ඇති පිළිතුරු අතරින් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| a. රාජ්‍ය දෙපාර්තමේන්තු | 1. සමූපකාර ණය දෙන සමිති (සණස) |
| b. සමූපාකාර සමිති | 2. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| c. රාජ්‍ය සංස්ථා | 3. ක්‍රීඩා සමිති |
| d. සමිති | 4. කෘෂි රක්ෂණ මණ්ඩලය |

(1) a, 4 / b, 2/ c, 3 / d, 1 (2) a, 4 / b, 3/ c, 1 / d, 2
(3) a, 2 / b, 1/ c, 4 / d, 3 (4) a, 2 / b, 4/ c, 1 / d, 3

(15) ගණකාධිකාරි, නීතිඥ වැනි වෘත්තීන්වල යෙදී සිටින පුද්ගලයන්ට වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධානය කුමක් ද?
(1) රාජ්‍ය සමාගම් (2) සමූපකාර සමිති (3) ඒක පුද්ගල ව්‍යාපාර (4)හවුල් ව්‍යාපාර

(16) ඒක පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාර නාමය පවත්වාගෙන යන්නේ නම්, ව්‍යාපාරය ආරම්භ කර කොපමණ දින ගණනක් ඇතුළත ලියාපදිංචි අයදුම්පත ඉදිරිපත් කළ යුතුවේද?
(1) දින 7යි. (2) දින 14යි. (3) දින 10යි. (4) දින 21යි.

(17) පහත ලබා දී ඇති ව්‍යාපාර සංවිධාන අතරින් ලාභ අරමුණු කරගෙන පවත්වාගෙන ව්‍යාපාර පමණක් අයත්වන පිළිතුර තොරන්න.
a. ක්‍රීඩා සමිති b. රාජ්‍ය සමාගම් c. රාජ්‍ය දෙපාර්තමේන්තු d. තනි පුද්ගල ව්‍යාපාර
e. හවුල් ව්‍යාපාර f. සමූපාකාර සමිති g. සංස්ථාපිත සමාගම් h. ගොවි සමිති
(1) b, c, d, e (2) b, d, e, g (3) a, c, d, e (4) d, e, f, g

(18) විදේශ රැකියාවක නිරත වී සිටි මෙරටට පැමිණි සේනාරත්න මහතා තම මුදල් යොදවා 'පිණි බිඳ ග්‍රොසරි' නමින් ව්‍යාපාරයක් ඇරඹීය. මෙම ව්‍යාපාරයේ ලක්ෂණයක් **නොවන්නේ,**
(1) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. (2) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
(3) වගකීම අසීමිත වීම. (4) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම.

(19) ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජනයක් **නොවන්නේ,**
(1) නෛතික පුද්ගලභාවයක් ලැබීම. (2) ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම.
(3) රජය ලබා දෙන දිරිගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම. (4) ණය ලබා ගැනීමේදී පහසුවක් වීම.

(20) වත්කම් හා හිමිකම් අඩුවීමට බලපාන ගණුදෙනුවක් වනුයේ,
(1) රු. 30 000ක් වටිනා යන්ත්‍රයක් මිලට ගැනීම. (2) අයිතිකරු රු. 200 000 ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
(3) රු. 50 000ක් ණයට ගැනීම. (4) විදුලි වියදම රු. 3 000ක් ගෙවීම.

(21) වත්කම් = හිමිකම් + වගකීම්
40 000 40 000
ඉහත බලපෑම සිදුකරන ගනුදෙනුව වනුයේ,
(1) විදුලි වියදම් ගෙවීම රු. 40 000 (2) බැංකු ණය ගෙවීම රු. 40 000
(3) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම රු. 40 000 (4) රු. 40 000ක බැංකු ණයක් ගැනීම.

(22) පහත සඳහන් අයිතම අතුරින් වත්කම් පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,
(1) භාණ්ඩ තොග, ණයගැති, බැංකු ණය, මුදල් (2) භාණ්ඩ තොග, ණයගැති, ආයෝජන, මුදල්
(3) භාණ්ඩ තොග, ණයහිමියෝ, ලද කොමිස්, මුදල් (4) භාණ්ඩ තොග, ණයහිමියෝ, විදුලි වියදම්, මුදල්

- **පහත ගනුදෙනු ඇසුරින් ප්‍රශ්න අංක 23 හා 24ට පිළිතුරු සපයන්න.**
A. බැංකු ණය ගෙවීම රු. 3 000 B. ගැණුම් රු. 25 000
C. විකුණුම් රු. 45 000 D. ලී බඩු මිළට ගැණීම රු. 20 000

(23) ඉහත ගනුදෙනු අතුරින් වත්කම් හා වගකීම් අඩුවීමට බලපාන්නේ,
(1) A (2) B (3) C (4) D

(24) ඉහත ගනුදෙනු අතුරින් වත්කම් අඩුවීමට හා වත්කම් වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,
(1) A (2) B (3) C (4) D

(25) කව්ෂ්ක ජයලත් මහතා රු. 800 000ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළේය.
මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,
(1) වත්කම් හා හිමිකම් රු. 800 000න් වැඩි වේ.
(2) වත්කම් රු. 800 000න් වැඩි වී වගකීම් රු. 800 000න් අඩුවේ.
(3) වත්කම් රු. 80 000ක් අඩු වී හිමිකම් රු. 800 000න් වැඩි වේ.
(4) වත්කම් හා හිමිකම් රු. 800 000න් අඩුවේ.

(26) ණයහිමි ගිණුම අයත් වන්නේ,
(1) වත්කම් ගිණුමකටය. (2) වියදම් ගිණුමකටය. (3) හිමිකම් ගිණුමකටය. (4) වගකීම් ගිණුමකටය.

(27) පහත සඳහන් ගිණුම් වර්ග වලින් ආදායම් ගිණුම්වලට පමණක් අයත් නිදසුන් දැක්වෙන්නේ,
(1) ගොඩනැගිලි ගිණුම, ණයගැති ගිණුම, මුදල් ගිණුම
(2) ණයහිමි ගිණුම, බැංකු ණය ගිණුම, ගෙවිය යුතු වියදම් ගිණුම
(3) විකුණුම් ගිණුම, ලැබූ වට්ටම් ගිණුම, පොලී ආදායම් ගිණුම
(4) විකුණුම් ගිණුම, ලැබූ වට්ටම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම

(28) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනුවකි.
**රු. 35 000ක බඩු තොගයක් ණයට ගැනීම**
මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,
(1) වත්කම් හා වගකීම් වෙනස් වේ. (2) වත්කම් පමණක් වෙනස් වේ.
(3) වගකීම් පමණක් වෙනස් වේ. (4) වත්කම් වගකීම් හිමිකම් සියල්ල ම වෙනස් වේ.

(29) පහත සඳහන් ගනුදෙනු අතුරින් හිමිකමට බලපෑම් ඇති නොකරන ගනුදෙනුව තෝරන්න.
(1) ව්‍යාපාරයේ විදුලි බිල රු. 5000ක් මුදලින් ගෙවීම. (2) රු. 5000ක් පොලී ආදායමක් ලැබීම.
(3) බැංකු ණය පොලී රු. 5000ක් ගෙවීම. (4) රු. 5000ක් ණය හිමියන්ට ගෙවීම.

(30) එක්තරා ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.
මුදල් ගිණුම හර රු. 40 000
ප්‍රාග්ධන ගිණුම බැර රු. 40 000
මෙයට අදාලව නිවැරදි ගනුදෙනුව වන්නේ,
(1) රු. 40 000ක දුරකථන බිල ගෙවීම. (2) රු. 40 000ක අමතර ප්‍රාග්ධනය යෙදීම.
(3) රු. 40 000ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම. (4) රු. 40 000ක බැංකු ණය මුදලින් ලැබීම.

(31) ව්‍යාපාරයේ අයිතිකරු තම පෞද්ගලික විදුලිබිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

| | | | |
|---|---|---|---|
| (1) විදුලි වියදම් ගිණුම | හර | (2) ගැනිලි ගිණුම | හර |
| මුදල් ගිණුම | බැර | විදුලි වියදම් ගිණුම | බැර |
| (3) ගැනිලි ගිණුම | හර | (4) විදුලි වියදම් ගිණුම | හර |
| මුදල් ගිණුම | බැර | ගැනිලි ගිණුම | බැර |

(32) පැතුම් සම්පත්ගේ ව්‍යාපාරයේ රු. 50 000ක් වටිනා භාණ්ඩ අත්පිට විකිණීමට හා රු. 35 000ක් වටිනා භාණ්ඩ අත්පිට මිලට ගැනීමට අදාල මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) ලදුපත හා වවුචරය (2) වවුචරය හා ලදුපත
(3) ඉන්වොයිසිය හා පිලිපත (4) ජ'නල් වවුචරය හා ලදුපත

(33) කසුන් තම ව්‍යාපාරයට රු. 75 000ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගෙන චෙක්පතකින් මුදල් ගෙවන ලදී. චෙක්පතකින් ගෙවීමට අදාළ මූලාශ්‍ර ලේඛනය නම්,

(1) ලදුපත (2) බැරපත (3) පිලිපත (4) ඉන්වොයිසිය

(34) පහත සඳහන් ප්‍රකාශ අතුරින් මුදල් පොත හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මුදල් පොත ලෙජර ගිණුමකි.
(2) මුදල් පොත මූලික සටහන් පොතකි.
(3) මුදල් වත්කම වැඩිවීම මුදල් පොතට බැර කරයි.
(4) ද්විත්ව සටහන් රීතියට අනුව මුදල් පොතේ ගනුදෙනු සටහන් කරයි.

(35) සමීරගේ ව්‍යාපාරය 2019 ජූනි මාසය තුළ ව්‍යාපාරයේ කටයුතු සඳහා ව්‍යාපාරයේ ජංගම ගිණුමෙන් රු. 150 000ක මුදලක් ලබා ගන්නා ලදී. ඊට අදාල ද්විත්ව සටහන වනුයේ,

| | | | |
|---|---|---|---|
| (1) මුදල් ගිණුම හර | 150 000 | (2) ගැනිලි ගිණුම හර | 150 000 |
| බැංකු ගිණුම | 150 000 | මුදල් ගිණුම | 150 000 |
| (3) බැංකු ගිණුම හර | 150 000 | (4) ගැනිලි ගිණුම හර | 150 000 |
| මුදල් ගිණුම | 150 000 | බැංකු ගිණුම | 150 000 |

(36) සංකල්පගේ ව්‍යාපාරය පිළියෙල කරන ලද බැංකු ගිණුමේ ශේෂය 2019 ජූනි 01 දිනට රු. 65 000කි. 2019 ජූනි මාසය තුළ රු. 75 000ක චෙක්පත් නිකුත් කර තිබූ අතර කිසිදු තැන්පත් කිරීමක් සිදු නොවුණි. 2019 ජූනි 30 දිනට බැංකු ගිණුමේ දැක්වෙනුයේ,

(1) රු. 10 000ක ශේෂයකි. (2) රු. 65 000ක ශේෂයකි. (3) රු. 10 000ක අයිරාවකි. (4) රු. 75 000ක අයිරාවකි.

- **37 හා 38 යන ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

චමෝදිගේ ව්‍යාපාරයේ 2019 ජූනි 30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 35 000කි.

| | |
|---|---|
| 2019 ජූනි මස නිකුත් කළ චෙක්පත්හි වටිනාකම | රු. 75 000 |
| 2019 ජූනි මස තැන්පත් කළ චෙක්පත්හි වටිනාකම | රු. 90 000 |
| 2019 ජූනි මස ස්ථාවර නියෝග ගෙවීම් | රු. 25 000 |
| 2019 ජූනි මස සෘජු ප්‍රේෂන | රු. 35 000 |

නිකුත් කළ සියලු චෙක්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති බව ද තැන්පත් කළ සියලු චෙක්පත් උපලබ්ධි වී ඇති බව ද උපකල්පනය කරන්න.

(37) 2019 ජූනි 01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය කොපමණ ද?

(1) රු. 45 000 (2) රු. 20 000 (3) රු. 50 000 (4) රු. 30 000

(38) 2019 ජූනි 30 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය කොපමණ ද?

(1) රු. 30 000 (2) රු. 10 000 (3) රු. 45 000 (4) රු. 35 000

(39) කේෂණිගේ ව්‍යාපාරය බඩු තොග ණයට ගැනීම සහ ණයට විකිණීම සිදුකරන ව්‍යාපාරයකි. හසිනිගේ ව්‍යාපාරයෙන් රු. 250 000ක් වටිනා භාණ්ඩ ණයට ලබාගත් අතර ණය පියවීමේදී ලද වට්ටම රු. 25 000කි. කේෂාණිගේ ව්‍යාපාරයට එම වට්ටම,

(1) වියදමකි. (2) වත්කමකි. (3) වගකීමකි. (4) ආදායමකි.

(40) ත්‍රිමාණිගේ ව්‍යාපාරයෙන් රු. 150 000ක් වටිනා භාණ්ඩ ණයට ලබාගත් ආමන්තට මසක් ඇතුළත ණය පියවීමට හැකි වුවහොත් 10%ක වට්ටමක් හිමිවේ. ත්‍රිමාණිගේ ව්‍යාපාරයේ වට්ටමට අදාල ද්විත්ව සටහන වනුයේ,

| | | | |
|---|---|---|---|
| (1) ණයහිමි ගිණුම හර | 15 000 | (2) දුන් වට්ටම් ගිණුම හර | 15 000 |
| ලද වට්ටම ගිණුම | 15 000 | ණයගැති ගිණුම | 15 000 |
| (3) දුන් වට්ටම් ගිණුම හර | 15 000 | (4) මුදල් ගිණුම හර | 15 000 |
| මුදල් ගිණුම | 15 000 | ලද වට්ටම් ගිණුම | 15 000 |